## අත්තනගල්ල ප්‍රා දේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග ලෙස සභාවට ලැබුණු රු.494,500 ක් වටිනා බේලින් යන්ත්‍රය ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) වේයන්ගොඩ කඩකාමර බදුදීම වෙනුවෙන් ලැබිය යුතු රු.4,093,624 හිඟ පෙර මුදල් ශේෂය ගිණුම්වලට ඇතුලත්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 02 කට අදාල රු.264,220 ක ණයහිමි ශේෂය අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සභා ව්‍යාපෘති 03 කට අදාල රු.575,295 ක් හා විමධ්‍යගත ව්‍යාපෘති 02 කට අදාල රු.23,286 ක් ණයහිමි ගිණුමේ වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඉ) 2017 කළගෙඩිහේන ප්‍රජාමණ්ඩල ගොඩනැගිල්ල පිහිටි ඉඩම වටා කම්බි ගසා ගේට්ටුව සකස්කිරීමේ අවසන්ගෙවීම රු.218,752 ක් වුවද රු.112,827 ක් ලෙස ගිණුම්ගතකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් රු.105,925 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 15 ක් සඳහා රු.5,235,187 ක ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණ ද, මෙම ව්‍යාපෘති සමාලෝචිත වසරේදී ආරම්භ කර නොතිබුණි. මෙම හේතුව නිසා ණයහිමි හා ප්‍රාග්ධන වැය ගිණුම් එම වටිනාකමින් වැඩිවී තිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

හිඟ ආදායම් ශේෂයේ විෂයයන් 03 කට අදාලව ගිණුමේ ශේෂයන් හා උපලේඛන වල ශේෂයන් අතර රු.18,859,347 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනා වශයෙන් 2013 වර්ෂයේදී හා 2015 වර්ෂයේදී ඉදිරිපත් කළ ව්‍යාපෘති 03 ක් ඉටු කිරීම සඳහා සභාව විසින් රු.1,664,911 ක් වැය කර තිබුණද එම මුදල් එම අමත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙනුවෙන් දරන ලද රු.49,500 ක මුදලක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

1.3.4 **<u>විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම</u>**

එගොඩපොත උපකාර්යාලයට අයත් රු.219,003,639 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි 234 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 **<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | 125,546 | මාස 06 සිට වර්ෂ 05 ක කාල පරාසයකට අයත් අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 (1) | | සෑම අර්ධ වර්ෂයකම අවසානයේ ඉකුත්වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 571 (2) | 3,920,597 | වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු ශේෂය සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ආ) | 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛය | | අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩකුලිය තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,964,007 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,568,027 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකිව තිබූ වාර්ෂිකව කල් පිරෙන ස්ථාවර තැන්පතු 06 ක සහ හයමාසිකව කල්පිරෙන ස්ථාවර තැන්පතු 02 ක රු. මිලියන 21 ක් ආයෝජනය කර තිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,909,000 | 35,427,575 | 30,751,450 | 26,372,753 | 18,151,000 | 18,308,551 | 19,817,026 | 21,696,628 |
| කුලී | 14,916,000 | 17,373,089 | 18,325,021 | 6,392,095 | 9,160,000 | 17,114,512 | 18,743,140 | 7,344,028 |
| බලපත්‍ර ගාස්තු | 1,012,000 | 292,410 | 311,410 | 202,958 | 934,000 | 1,546,550 | 1,550,550 | 221,957 |
| වෙනත් ආදායම් | 69,196,000 | 69,928,143 | 24,643,077 | 126,813,288 | 73,345,000 | 108,075,102 | 87,427,875 | 81,528,223 |

2.3.2 **වරිපනම්**

සභාව විසින් ඉදිරිපත් කරන ලද කාලවිශ්ලේෂණ අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.22,071,199 ක්වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 1 සිට වසර 05 දක්වා රු.8,972,794 ක්, වසර 5 සිට වසර 10 දක්වා රු.9,242,176 ක් හා වසර 10 ට වැඩි රු.3,856,229 ක් ඇතුළත් වූ අතර, මෙම හිඟයන් අයකර ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

2.3.3 **කඩකුලී**

(අ) එගොඩපත උප කාර්යාලයට අයත් පදික කඩ 50 ව්‍යාපෘතියේ කඩ කාමර 06 කින් අයවීමට ඇති වසර 10 කට වඩා පැරණි පෙර මුදල් හිඟ ශේෂය 2018 ජූලි 31 දිනට රු.134,651 ක්, කඩ 48 ව්‍යාපෘතියේ කඩකාමර 07 කින් වසර 10 කට වඩා කල්ගත වූ පෙර මුදල් හිඟ ශේෂය රු.883,682 ක් සහ වේයන්ගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 27 කින් වසර 10 කට වැඩි කල්ගතවූ පෙර මුදල් හිඟ ශේෂය රු.4,093,626 ක් විය.

(ආ) වේයන්ගොඩ උපකාර්යාලයට අයත් පොදු වෙළඳපළ වසා ඇති කඩකාමර 21 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති කුලිය රු.588,795 ක් වූ අතර, විවෘතකර ඇති කඩකාමර 14 කින් අයවීමට ඇති කුලිය රු.299,163 ක් විය.

2.3.4 **වෙනත් ආදායම්**

**පරිසර බලපත්‍ර**

2017 වර්ෂයට අදාලව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පරිසර බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාර ලෙස හඳුනාගෙන තිබූ ව්‍යාපාර සංඛ්‍යාව 177 ක් වූ නමුත් 2016 සහ 2017 වර්ෂ දෙක තුළදී පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණේ ව්‍යාපාර 76 ක් පමණි.

2.3.5 **<u>මුද්දර ගාස්තු හා උසාවි දඩ</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 ජූලි 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ආදායම රු.79,194,338 ක් විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1. **<u>කාර්යසාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **<u>අතුරු ව්‍යවස්ථා</u>**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 17 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

සමාලෝචිත වර්ෂයට අදාලව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම වෙනුවෙන් දැරූ මුළු පිරිවැය රු.48,762,491 ක් වූ අතර එයින් නොදිරන කසළ අවසන් බැහැර කිරීම සිදුකරන වේයන්ගොඩ දඹුවවත්ත හිමිකරුට රු.7,139,000 ක් ගෙවා තිබුණි. එහෙත් අවසන් බැහැර කිරීමට යොමුකරන ලද කසළ ප්‍රමාණයේ මිණුම් ගෙන සනාථ කරගැනීමකින් තොරව කාලය පදනම් කරගෙන ගෙවීම් සිදුකර තිබුණි. මෙම කසළ බැහැර කල ස්ථානයට පරිසර බලපත්‍රයක් නොතිබුණි.

(ඈ) **<u>පාරිසරික ගැටළු</u>**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද ගස් කැපීම්වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව 91 ක් සහ අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 30 ක් වූ අතර ගස්කැපීම්වලට අදාළ පැමිණිලි 06 ක් සම්බන්ධයෙන් පමණක් ක්‍රියා කොට තිබුණි.

(ඉ) **<u>ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති</u>**

විවිධ මූලාශ්‍ර ප්‍රතිපාදන යටතේ ලද ව්‍යාපෘති 522 න් ව්‍යාපෘති 18 ක් 2018 මැයි 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ වැඩසටහන් යටතේ ව්‍යාපෘති 08 ක් අවිච්ඡේද කර තිබුණි.

(ඊ) **<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජූනි 14 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සොරකම් කරන ලද වටිනාකම රු.494,500 ක් වූ ජල මෝටර් පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතුකර නොතිබුණු අතර එම පාඩුව හානි පාඩු ලේඛනයේද සටහන්කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂවලට අදාලව පොදුතැන්පත් ගිණුමේ සටහන් නොතැබීම හා ගිණුම් තුලනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.35,228,024 ක විවිධ තැන්පත් ශේෂයේ නිරවද්‍යතාව සම්බන්ධයෙන් විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඇ) තත්කාර්ය අත්තිකාරම් සම්බන්ධයෙන් අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර නිලධාරින්ට ලබාදී තිබූ අත්තිකාරම් ද, ණයගැති ලේඛනයට ඇතුලත් කිරීම තුලින් ණයගැති ශේෂය තහවුරුකර ගැනීමට හැකියාවක් නොතිබුණි.

(ඇ) ප්‍රචාරක දැන්වීම්වලට මුදල් අයකර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ කිසිදු උපකාර්යාලයක ප්‍රචාරක දැන්වීම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබූ අතර මේ හේතුවෙන් ගෙවීම් කරන ලද ප්‍රචාරක දැන්වීම් පිළිබඳව භෞතික පරීක්ෂාවක් සිදුකර හඳුනා ගැනීමේ හැකියාවක් නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 03 | 03 | - | - |
| තෘතීයික | 06 | 06 | 01 | 01 |
| ද්විතීයික | 58 | 57 | 02 | 01 |
| ප්‍රාථමික | 165 | 186 | 01 | (25/2014) 20 |
| | 232 | 252 | 04 | 22 |

(i) ආදායම් පරීක්ෂක තනතුරු 04 ක් 2010 වර්ෂය සිට 2015 වර්ෂය දක්වා කාල පරාසය තුල පුරප්පාඩුවී තිබූ අතර එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ස්ථිර පත්වීම් ලබාදී ඇති සේවකයින් 20 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට එකතුකර නොතිබුණි.

(ආ) **සේවක ණය**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අය නොවී පවතින හිඟ ණය ශේෂය රු.1,088,601 ක් වූ අතර 1990,1993 හා 2001 වර්ෂවල හා ඊට පෙර සිට පැවත එන හිඟ ණය ශේෂ මේ අතර විය. ස්ථාන මාරු හා විශ්‍රාම යාම වැනි හේතු මත අය නොවී පවතින මෙම සේවක ණය, මරණ පාරිතෝෂික, විශ්‍රාම පාරිතෝෂික හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර

නොතිබුණි. අදාල ණය ලිපිගොනු, අයවීම් ඇණහිටි දිනයන් හා ඇපකරුවන්ගේ විස්තර යනාදී වැදගත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල අනුමත ඉදිකිරීම් සැලසුම් සංඛ්‍යාව 198 ක් වූ අතර අනුකූලතා සහතික ලබා දී තිබුණේ 05 ක් සඳහා පමණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කට්ටිකර විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ට සමාන බද්දක් අයකරගත යුතු වුවත් සභාවේ නිලධාරියෙකුගේ තක්සේරුවක් පදනම් කරගෙන එම බදු මුදල අයකිරීම සිදුකර තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ නිට්ටඹුව නගරයේ ඉදිකර තිබූ කඩ 48 ව්‍යාපෘතියට අයත් කඩකාමර 20 ක් පමණ කුලී හිමියන් විසින් ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 10 ක පමණ කාලයක සිට වසා දමා තිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

3.5.1 **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.**

සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ වාර්තාවට අනුව අස්ථානගතවී තිබූ රු.166,270 ක් වටිනා පුස්තකාල පොත් සහ 2016 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවට අනුව අස්ථානගතවී තිබූ රු.30,069 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5.2 **පවරා නොගත් වත්කම්**

ගිණුම්වල ඇතුලත්කර ඇති රු.3,205,221 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි ඔප්පු මගින් පවරාගෙන නොතිබුණි.

3.5.3 **නිෂ්ක්‍රිය වත්කම්**

ප්‍රයෝජනයට ගත නොහැකි රු.752,561 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

3.6 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) ඍජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය යටතේ ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත් පැවරීමේදී 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් සමග ව්‍යාපෘති වලට අදාල ගිවිසුම් අත්සන් කිරීමේදී දිනය හා විස්තර ඇතුලත් කරමින් විධිමත් ලෙස ගිවිසුම අත්සන් කිරිමට කටයුතු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. 2017 වර්ෂයේදී ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 2 ක වැඩ 2018 අප්‍රේල් 10 දින වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර එදිනට ගිවිසුම්ගත කාලය ද ඉක්මවී තිබුණි.

4. **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අයවැය පාලනය**

වැය විෂයයන් 06 කට අදාලව ඇස්තමේන්තු කරන ලද රු.10,825,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි කර තිබූ අතර ඉතිරි වැය විෂයයන් 06 කට අදාලව ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් 12% සිට 98% දක්වා

ප්‍රමාණයක් ඉතිරිව තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) | වත්කම් හා දේපළ | (i) | භෞතිකව නොමැති වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීම |
| | | (ii) | වත්කම්වලට අදාල අයිතිය තහවුරු කිරිමට ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා නොගැනීම |
| (ඇ) | සේවක කළමනාකරණය | (i) | කාර්යමණ්ඩලය විධිමත් කර නොගැනීම |
| | | (ii) | පුරප්පාඩු සම්පූර්ණකර නොගැනිම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | විධිමත් පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම |
| | | (ii) | ගිවිසුම් විධිමත්ව සකස් නොකිරීම |
| (ඉ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් හා කඩකුලී තක්සේරු නොකිරීම |
| | | (ii) | හිඟ ආදායම් වර්ධනයවීම |
| | | (iii) | ඌන උපයෝජිත කඩකාමර නැවත ටෙන්ඩර් ලබා නොදීම |
| | | (iv) | වරිපනම් බදු ප්‍රතිශත සංශෝධනය නොකිරීම |